01 දරුවකුගේ භාරකාරත්වය සම්බන්ධ නීතිය කෙබඳුද?

- දික්කසාද නඩුවකදී හෝ දරුවන්ගේ භාරකාරත්වය පිළිබඳ පවරන නඩුවකදී මවුපිය දෙපාර්ශ්වයටම දරුවන්ගේ අයිතිවාසිකම ඉල්ලා සිටිය හැකිය.
- දරුවකුගේ නෛතික හා ශාරීරික භාරකාරත්වය මවුපියන්ගෙන් එක් අයකුට හිමි වුවද දරුවා වෙත ප්‍රවේශ වීමට අනෙක් පාර්ශ්වයට ඇති අයිතිය අධිකරණය විසින් අහෝසි නොකරයි.
- දරුවාගේ වයස අවුරුදු 10ට වඩා වැඩි වන විට භාරකාරත්වය තීරණය කිරීමේදී දරුවාගේ මතයද අධිකරණය විසින් විමසා සිටී.
- දරුවන් මව හෝ පියා භාරයේ තැබිය යුතු යැයි නිශ්චිත විධානයක් නොමැති අතර පාර්ශ්වයන්ගේ ඉල්ලීම්, දරුවාගේ උපරිම යහපතට අදාළ අවස්ථානුගත කරුණු සලකාබලා සුදුසු පරිදි නියෝගයක් කිරීමට අධිකරණයට හැකිය.

02 බාලවයස්කාර දරුවන්ගේ දේපළ විකිණීම හෝ පැවරීම කළ හැකිද?

බාලවයස්කරුවකු සතු දේපළ විකිණීමට හෝ වෙනත් අයකුට පැවරීමට හෝ දේපළෙහි වටිනාකම අඩුවන කිසිදු ක්‍රියාවක් කිරීමට දරුවන්ගේ මවුපියන්ට පවා අවසර නොමැත. දරුවාගේ අධ්‍යාපනය හෝ සුබසිද්ධිය සලසන වෙනත් කරුණක් සඳහා එවැනි දේපළක් විකිණීමට පැවරීමට හෝ එහි වෙනසක් සිදු කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා දිසා අධිකරණයෙන් අවසර ගත යුතුය.

03 දරුවකු දරුකමට හදා වඩා ගැනීම සම්බන්ධ නීති තත්ත්වය කුමක්ද?

දරුවකු ස්වාභාවික මව හෝ පියා නොවන නමුත් සුජාත දරුවකු මෙන් නීතියෙන් නියම කළ ආකාරයෙන් හදා වඩා ගැනීම, කුලවද්දා ගැනීම නම් වේ.

ස්වාභාවික මව හෝ පියා හෝ භාරකරුවකුගේ කැමැත්ත නොමැතිව දරුවකු කුලවද්දා ගැනීමටද ප්‍රතිපාදන පවතී. දරුවකු ඔවුන්ගේම දරුවකු ලෙස සලකමින් සද්භාවයෙන් අවුරුදු 2කට වඩා හදා වඩා ගත් හෙයින්ද අධ්‍යාපනය හා රැකවරණය ලබාදුන්හෙයින්ද දරුවාගේ ස්වාභාවික මවුපියන් දරුවා අත්හැර දමා ඇතිහෙයින්ද 1941 අංක 24 දරන දරුකමට හදා වඩා ගැනීම පිළිබඳ පනතේ වගන්ති ප්‍රකාරව දරුවාගේ අනාගත අභිවෘද්ධිය සඳහා දරුවා දරුකමට හදා ගැනීමේ ආඥාවක් එතෙක් දරුවා හදාවඩාගත් මවුපියන්ට දිසා අධිකරණයෙන් ඉල්ලා සිටිය හැකිය.

04 66 නඩුකර යනු මොනවාද?

ප්‍රාථමික නඩු විධාන පනතේ 66 වගන්තියේ සිට ඉදිරියට ඇති වගන්තිවලින් දක්වන දේපළ සම්බන්ධ නඩු කටයුතු මින් අදහස් කෙරේ. මෙම නඩුකරයක් මහෙස්ත්‍රාත් අධිකරණයක ගොනු කිරීමට පහත අංග දෙක සම්පූර්ණ විය යුතුය.

- දේපළ පිළිබඳ ආරවුලක් විය යුතුය.
- ඒ හේතුවෙන් සාමය කඩවීමක් හෝ සාමය කඩවීමේ අවදානමක් ඇති විය යුතුය.

ඉහත අංග දෙකම සම්පූර්ණ නොවන කල 66 වගන්තිය ප්‍රකාරව නඩු ඇසීමට මහෙස්ත්‍රාත් අධිකරණයට අධිකරණ බලය නැත. දේපළ පිළිබඳ ආරවුල් යන්නට එකී දේපළේ බුක්තිය මෙන්ම එයට බලපාන වෙනත් අයිතිවාසිකම් ද (පරවශතා වැනි) අදාළ වේ.

05 66 වගන්තිය යටතේ නඩුකරයක් පැවරූ විට අධිකරණයකට දිය හැකි නියෝග වර්ග?

(i). තොරතුරු වාර්තාව ගොනු කිරීමට ප්‍රථමයෙන් වූ මාස 02ක් ඇතුළත බුක්තියේ සිටි අයකුට බුක්ති විඳීමේ අයිතිවාසිකමක් ඇති බව තහවුරු කරමින් නියෝගයක් ලබාදීම.

(ii). තොරතුරු වාර්තාව ගොනු කිරීමට ප්‍රථමයෙන් වූ මාස 02ක් තුළ බුක්තියේ සිටි අයකුගේ බුක්තිය බලහත්කාරයෙන් අහිමිකර ඇත්නම් ඔහුව නැවත බුක්තියේ පිහිටුවීමේ නියෝගයක් ලබාදීම.

(iii). දේපළක බුක්තිය පිළිබඳ ආරවුලක් නොවන වෙනත් නීතිමය අයිතිවාසිකම් ඇත්නම් ඒ අයිතිවාසිකම් බුක්ති විඳීමට අවස්ථාව සලසාදීම.

06 66 නඩුකරයක් හවුල් දේපළක් සම්බන්ධව පැවරිය හැකිද?

66 නඩුවක් සමථ කිරීමට හැකියාව තිබේද යන්න අධිකරණය විසින් සලකා බැලිය යුතු අතර එසේ නොමැත්තේ නම් අදාළ ලේඛන මත නියෝගයක් ලබාදීම සිදු කරයි. මහෙස්ත්‍රාත් අධිකරණයකින් ලබාදෙන නියෝගය අවසාන නියෝගයක් නොවන නිසා අයිතිවාසිකමක් ලෙස එකී නියෝගයන්ට එරෙහිව අභියාචනා කිරීමට නොහැකිය.

බුක්තිය අහිමි කරන ලද ගොඩනැගිල්ල නියෝගය ලබාදෙන අවස්ථාවේ නොපවතින්නේ නම් බුක්තියේ පිහිටුවීම පිණිස එය නැවත සෑදීමට නියෝගයක් මහෙස්ත්‍රාත්තුමාට කළ නොහැකිය. අදාළ ස්ථාන කඩා දැමීමට වගකිව යුතු අයගෙන් වන්දි ලබා ගැනීම පිණිස සිවිල් නඩුකරයක් පැවරීමට අගතියට පත් පාර්ශ්වයට හැකියාව තිබේ.



දෛනික ජීවිතයේදී
මව්බිම පාඨකයන් පීඩාවට
පත් කරන නීතිමය ප්‍රශ්න ගැන
සෑම බදාදා දිනකම 'ගයිඩ්ලයින්' පිටුවෙන්
පිළිතුරු ලබාදේ. නීති ආධාර කොමිෂන් සභාවේ
විද්වත් නීතිඥ කණ්ඩායමක් විසින් එම පිළිතුරු
සම්පාදනය කරනු ලැබේ.
ඔබේ ගැටලුව මව්බිම ලීගල් ඒඩ්, නීති ආධාර
කොමිෂන් සභාව, 129, මහාධිකරණ සංකීර්ණය,
අලුත්කඩේ, කොළඹ 12, දුරකථන 011 2433618 හෝ
ඊමේල් legalaidcommission1978@gmail.com
වෙත යොමු කරන්න.

උපදෙස් සහ ලිපි සැකසුම
නීතිඥ දර්ශිකා මඩුගල්ලේ
නීතිඥ නිලූෂා කුමාරි විජේරත්න
නීති නිලධාරී
නීති ආධාර කොමිෂන් සභාව

GUIDELINE
Right එක දැනගෙන Fight කරන්න

පාසල් ළමයකු දැනගත යුතු නීතිය

1989 නොවැම්බර් 20 වැනි දින එක්සත් ජාතීන්ගේ මණ්ඩලය විසින් සම්මත කරන ලද 'ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය' ලොව පුරා වෙසෙන ළමයින්ගේ නීත්‍යනුකූල වගකීම් හා අයිතිවාසිකම් නිශ්චය කර දැක්වීමේදී ඉතා වැදගත් වන නීති මූලාශ්‍රයකි. ශ්‍රී ලංකාව ඇතුළු එම ප්‍රඥප්තියට අස්සන් තැබූ බොහෝ රටවල් තම රටවල ළමයින්ගේ වගකීම් හා අයිතිවාසිකම්වලට සම්බන්ධ කටයුතුවලදී මූලාශ්‍රය කරගන්නේ මෙම ළමා අයිතිවාසි ප්‍රඥප්තියයි" ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ළමයා යනු වයස අවුරුදු 18ට අඩු තැනැත්තෙක් වේ. මේ අනුව උපතේ සිට වයස අවුරුදු 18 සම්පූර්ණ කරන තෙක් එම වයස් කණ්ඩායමට අයත් සියලුම තැනැත්තන් එම ප්‍රඥප්තිය අනුව ළමයින් වේ. මෙම ප්‍රඥප්තියට අනුකූල වෙමින් ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය වැනි නීතිවල මෑතකාලීන සංශෝධන මඟින්ද 'ළමයා' යනු වයස අවුරුදු 18ට අඩු තැනැත්තකු යනුවෙන් අර්ථ නිරූපණය කරයි.

1988 අංක 28 දරන දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනතේ 280 (2) වගන්තිය අනුව 'ළමයා' යනු වයස අවුරුදු 18ට අඩු තැනැත්තෙකි. එසේම 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතේ 286 (2) වගන්තිය අනුව 'ළමයා' යනු වයස අවුරුදු 18ට අඩු තැනැත්තෙකි. එසේම 1998 අංක 55 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිළිබඳ පනතේ 39 වගන්තිය අනුව 'ළමයා' යනු වයස අවුරුදු 18ට අඩු තැනැත්තෙකි. මේ හැර ශ්‍රී ලංකාවේ සාමාන්‍ය විවාහ හා දික්කසාද නීතියට අනුව පුරුෂයකු කාන්තාවක් හෝ විවාහ වීමට සුදුසුකම් ලබන්නේ වයස අවුරුදු 18ට සම්පූර්ණ කළ පසු වේ. ශ්‍රී ලංකාවේ වයෝපූර්ණත්ව නීතිය (Age of Majority) ළමයකු වැඩිහිටි වයසට එළැඹෙන්නේ කවර වයසකදැයි නිශ්චය කරන ඉතා වැදගත් නීති මූලාශ්‍රයක් වේ. කිසියම් පුද්ගලයකු නීතිය විසින් වැඩිහිටියකු ලෙස සලකන්නේ වයස අවුරුදු 18ට සම්පූර්ණ වීමෙන් පසුව බව මෙම නීති මූලාශ්‍රයෙහි සඳහන් වේ. මේ අනුව වයස අවුරුදු 18ට වැඩි තැනැත්තන් වැඩිහිටියන් ලෙස සලකයි. වයස අවුරුදු 18ට අඩු තැනැත්තන් බාල වයස්කාරයන් හෙවත් ළමයින් ලෙස සලකනු ලබයි. මෙලෙස ශ්‍රී ලංකාවේ වලංගු 'ළමයින්' ලෙස අර්ථ නිරූපණය කරන තැනැත්තන් වයස අවුරුදු 18ට අඩු තැනැත්තන්ය. එම වයස් කණ්ඩායමට අයත් සියලුම තැනැත්තන් ළමයින් වේ.

ළමයින්ට අදාළ කරුණුවලදී මීට වඩා වෙනස් අර්ථ නිරූපණයන් දක්වන අවස්ථාද තිබේ.

ළමයකු රැකියාවක යෙදවීම නීති විරෝධී වන බවත් එවැනි නීති විරෝධී ක්‍රියාවන් කරනු ලැබූ තැනැත්තකු නීතිය අනුව දඩයකට, බන්ධනාගාරගත කිරීමකට හෝ දෙකටම යටත් විය යුතු බවත් සඳහන් නීති මූලාශ්‍රයේ 'ළමයා' යනු වයස අවුරුදු 14ට අඩු තැනැත්තකු ලෙස අර්ථ නිරූපණය කරයි.

1956 අංක 47 දරන ස්ත්‍රීන් හා තරුණයන් සේවයෙහි යෙදවීමේ පනතට අනුව වයස අවුරුදු 14 සිට 18 දක්වා වූ වයස් සීමාවල ළමුන් සීමා සහිත රැකියාවන්හි පමණක් යොදාගත හැකිය. එම පනතට අනුව නීතියෙන් නියම කර ඇති රෙගුලාසි උල්ලංඝනය කරමින් වයස අවුරුදු 14 සිට 18 දක්වා වයස් කාණ්ඩයේ ළමයින් සේවාවේ යෙදවීම නීතියට අනුව දඬුවම් ලැබිය හැකි වරදකි.

1977 අංක 100/35 දරන රජයේ ගැසට් පත්‍රය අනුව වයස අවුරුදු 14ට අඩු ළමයින් අනිවාර්යයෙන් පාසල් යැවිය යුතු වේ. මේ අනුව පාසල් යන ළමයා ලෙස මෙහි අර්ථ නිරූපණය කර ඇත්තේ වයස අවුරුදු 14ට අඩු තැනැත්තන්ය.

දණ්ඩ නීති සංග්‍රහයට අනුව වයස අවුරුදු 16ට අඩු ළමයකු සමඟ ඇයගේ කැමැත්ත ඇතිව හෝ නැතිව ලිංගික හැසිරීමේ යෙදීම වරදකි.

ශ්‍රී ලංකාවේ වලංගු නීතිය අනුව ළමයකුගේ උපරිම වයස අවුරුදු 18 යන්න නිශ්චිත සහ පැහැදිලි වේ. ළමයකු අයත් වන වයස් කාණ්ඩයේ අවම වයස නිශ්චය කර ගැනීමේදී දණ්ඩ නීති සංග්‍රහයේ 306 සහ 307 වගන්තිය ඉතා වැදගත් වේ.

දරුවකු ඉපදීමට පෙර හෝ දරුවා පණ ඇතිව ඉපදීම වැළැක්වීමට හෝ එම දරුවා ඉපදීමෙන් පසු ඔහුගේ හෝ ඇයගේ මරණය සිදු කිරීමේ අදහසින් යමකු යම් ක්‍රියාවක් කරනු ලැබ එම ක්‍රියාව පණ ඇතිව හෝ දරුවාගේ ඉපදීම වළක්වතොත් හෝ එම දරුවා ඉපදීමෙන් පසු ඔහුගේ මරණය සිදු කළහොත් එම ක්‍රියාව කිරීමේ අපරාධ වරදට වරදකරුවකු වූ තැනැත්තකුට අවුරුදු 10ක් දක්වා බරපතළ සිර දඬුවමක් හෝ දඩයකින්ද නැතහොත් ඒ දඬුවම් දෙකම මඟින්ද දඬුවම් කළ හැකි වේ.

යම් ක්‍රියාවකින් මවකගේ මරණය සිදුකළහොත් යමකු එම ක්‍රියාව කොට ගැබ මේරූ නමුත් නොඉපදුණු ළදරුවකුගේ මරණය රීති ක්‍රියාවෙන් සිදුකළහොත් ඔහුට අවුරුදු 10 දක්වා කාලයක දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතුය. ඔහු දඩයකටද යටත් විය යුතුය.

මේ අනුව මවු කුසෙහි කලලයක් හටගත් අවස්ථාවේ සිට එම ජීවියා නීතිය විසින් දරුවකු ලෙස සලකනු ලබයි. එසේම එම ජීවියාට ජීවත් වීමට ඇති අයිතිය නීතිය විසින් පිළිගනු ලබයි.

ගබ්සා කිරීම වැනි ක්‍රියාවකින් එම දරුවා ඉපදීමට පෙර ඔහුගේ ජීවත්වීමේ අයිතිය අහිමි කිරීම හෝ එම දරුවා ඉපදීම වැළැක්වීමේ ක්‍රියාවන් කිරීම ශ්‍රී ලංකාවේ නීතිය අපරාධයක් ලෙස සලකන බව ඉහත දක්වා ඇති කරුණු අනුව පැහැදිලි වේ.

මේ අන්දමින් කලල අවස්ථාවේ සිට කුස තුළ ජීවත් වන ජීවියා දරුවකු වශයෙන් හඳුන්වයි. ඉන්පසු දරුවා ළදරුවා, ළමයා, බාල වයස්කාරයා වැනි විවිධ යෙදුම්වලින් හඳුන්වන වයස අවුරුදු 18ට අඩු සියලු තැනැත්තන් ශ්‍රී ලංකාවේ වලංගු නීතිය 'ළමයින්' ලෙස අර්ථකථනය කරනු ලැබේ.

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය අනුව වයස අවුරුදු 18ට අඩු සියලු තැනැත්තන් ළමයින් ලෙස අර්ථ නිරූපණය කරන අතර එම වයස් කාණ්ඩයට අයත් සියලුම ළමයින් මානසික හා කායික වශයෙන් නොමේරූ තැනැත්තන් ලෙස විශේෂකොට හඳුන්වනු ලබයි. වයස අවුරුදු 18ට අඩු මානසික හා කායික වශයෙන් නොමේරූ වර්ධන අවස්ථාවක පසුවන ළමයින් අතුරෙන් පාසල් යන ළමයින් යනුවෙන් නීතිය හඳුන්වන ළමුන්ගේ නීතිමය වගකීම් හා නීතිමය අයිතිවාසිකම් හඳුනා ගැනීම ඉතා වැදගත් වේ.

මවුකුස සහ ළමයා

සියලුම ළමුන් මවකගේ කුසෙහි පිළිසිඳගෙන මවකගේ කුස තුළ ළමයකු ලෙස ජීවත් වී වර්ධනය වෙති.

මවු කුස තුළදී ළමයාගේ ජීවත් වීමට ඇති හිමිකම ආරක්ෂා කරගැනීමට නීතිය වග බලා ගත යුතු වේ. ගබ්සා කිරීම දඬුවම් කළ හැකි අපරාධයක් වන අතරම මවු කුස තුළ සිටින ළමයාගේ ජීවත් වීමට ඇති අයිතියට හානි පැමිණෙන ලෙස මවගේ ජීවිතයට හානි පැමිණවීමද දඬුවම් දිය යුතු අපරාධයක් බව එම නීතිවල වැඩිදුරටත් සඳහන් වේ.

පවුල සහ ළමයා

ළමයාට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැලැස්වීමෙහිලා පවුල සතු වගකීමටද මවුපියන්ගේ අයිතීන් හා වගකීම්වලටද ආණ්ඩුව ගරු කළ යුතු බව ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 5 වැනි වගන්තියේ සඳහන් වේ.

"පවුල සමාජයේ මූලික ඒකකය වශයෙන් රජය විසින් පිළිගෙන ආරක්ෂා කළ යුතු බව," ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම හා මූලික යුතුකම දැක්වෙන 27 (12) වගන්තියේ සඳහන් වේ.

"ළමයින් හා යෞවනයන් කායික වශයෙන්, මානසික වශයෙන්, සදාචාරාත්මක වශයෙන්, ආගමික වශයෙන් හා සාමාජීය වශයෙන් පූර්ණ වර්ධනයට පත්වන බවට වගබලා ගැනීමටත්, ඔවුන් ආත්මාර්ථය පිණිස යොදා ගනු ලැබීමෙන් සහ වෙනස්කම්වලට පාත්‍ර කරනු ලැබීමෙන් ආරක්ෂා කර ගැනීමටත් හැකිවන පරිදි ඔවුන්ගේ සුබසිද්ධිය රජය විසින් විශේෂ පරිශ්‍රමයකින් වර්ධනය කළ යුත්තේ යැයි" 27 (13) වගන්තියේ සඳහන් වේ.

මෙලෙස 'පවුල්' සමාජ ක්‍රමයෙහි මූලික ඒකකය වශයෙන් ජාත්‍යන්තර නීතිවලින් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියෙන්ද පිළිගන්නා අතර "පවුල" නම් සංස්ථාවේ මනා පැවැත්ම සුරක්ෂිත කිරීම අරමුණු කර ගනිමින් පනවා ඇති නීතිද රාශියක් වේ. මෙම නීති සමූහය හැඳින්වීමට පවුල් නීතිය (Family Law) නම් යෙදුම භාවිත වේ.

පවුල් නීතිය හා ළමයා

විවාහ නීතිය, දික්කසාද නීතිය, නඩත්තු නීතිය සහ දරුවන් හදා වඩා ගැනීමේ නීතිය වැනි විවිධ නීති ගණනාවක් මඟින් 'පවුල' නම් සංස්ථාවෙහි නීත්‍යනුකූලභාවය තහවුරු කිරීමට හා පවුලේ සාමාජිකයන්ගේ අන්‍යොන්‍ය වගකීම් හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හේතුවන විවිධ නීති හා විධිවිධාන වනවා ඇත.

පවුල් නීතිය යටතේ පනවා ඇති බොහෝ නීති ළමයින්ගේ නීතිමය වගකීම් නිශ්චය කර දැක්වීමටද ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටද පනවා ඇති නීති වශයෙන් වැදගත් වේ.

පාසල හා ළමයා

පවුලක දරුවන් පරිපෝෂණය කිරීම මවුපියන් සතු දෛනික යුතුකමක් බව පවුල් නීතිය අවධාරණය කරයි. 'දරුවකු පරිපෝෂණය' කිරීම යන්නට දරුවන්ට ආහාර, ඇඳුම්, පැලඳුම්, ඉඳුම් හිටුම්, බෙහෙත් ලබාදීම මෙන්ම දරුවන්ට අධ්‍යාපනය හා පුහුණුව සපයා දීමද ඇතුළත් වන බව පවුල් නීතියට සම්බන්ධ නීති ග්‍රන්ථවලින් මෙන්ම එම නීතිය මුල්කොට විනිශ්චයට භාජන වූ නඩු ගණනාවකින්ද සනාථ වේ.

මේ අනුව පවුලක මවුපියෝ තම දරුවන් පෝෂණය කිරීමේදී තමන්ට පැවරී ඇති එක් නෛතික යුතුකමක් වූ තම දරුවන්ට අධ්‍යාපනය හා පුහුණුව ලබාදීම සඳහා එම කාර්ය ඉටු කිරීම සඳහාම සංවිධානය කර ඇති මූලික ආයතනය වූ පාසල නම් සංවිධානය සමඟ සම්බන්ධතා පවත්වයි. තම දරුවන්ගේ අධ්‍යාපන හා පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කරගැනීම සඳහා මවුපියෝ තම දරුවන් පාසල් යවති.

පාසලේද පෙර පාසල් හෙවත් පූර්ව පාසල්, රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා ජාත්‍යන්තර පාසල් වශයෙන් නොයෙකුත් ආකාරයේ පාසල් තිබේ. නමුත් මා මෙම ලිපි මාලාව මඟින් ඔබ වෙත කරුණු ගෙන ඒමට අදහස් කරනු ලබන්නේ වයස අවුරුදු 5 සම්පූර්ණ වූ පසු පළමු වසරට ඇතුළත් කරගෙන අදාළ වසරට නියමිත විෂය නිර්දේශයන් මඟින් අධ්‍යාපනය ලබා දෙන විධිමත් පාසල් පමණි. එකී පාසල යනු කුමක්ද යන්න පිළිබඳව සහ ඊට අදාළ වැදගත් කරුණු රාශියක් පිළිබඳව ඉදිරි ලිපියක් මඟින් මා විසින් පාඨක ඔබ වෙත වැදගත් කරුණු රාශියක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි.

නීතිඥ
ගංගා ජයාංගනී සෝමරත්න
නීති නිලධාරී
නීති ආධාර කොමිෂන් සභාව
කොළඹ